## දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

## කොළඹ දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 ඔක්තෝබර් 16 දින සභාවේ නගරාධිපතිවරයා වෙත යවන ලදි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

2007 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.7,400,000 ක් වූ ගිලන් රථයේ වටිනාකම රු.740,000 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු.482,028,719 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාල ශේෂයන් ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තා වල දැක්වෙන ශේෂයන් සමග සැසඳීමේදී රු.12,218,151 ක වෙනසක් නිරීක්ෂණය විය.

#### 1.3.3 ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රු.78,095,155 ක් වු වියදම් ණය හිමි ශේෂය තුල අවුරුදු 3 හා 4 අතර කාලයට අදාල ණයහිමි ශේෂය රු.699,074 ක් ද, අවුරුදු 6 ඉක්මවා තිබු ණයහිමි ශේෂය රු.18,838,855 ක් ද විය.

(ii) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ආපසු ගෙවියයුතු තැන්පතු ශේෂ වල එකතුව රු.34,469,003 ක් වු අතර, පිළිවෙලින් රු.2,172,100 ක් හා රු.258,750 ක් වු ආදායම් තැන්පතු සහ ටෙන්ඩර් තැන්පතු ශේෂ 2002 වර්ෂයේ සිට නොවෙනස්ව ඉදිරියට ගෙනවිත් තිබුණි. තවද, රු.29,985,792 ක් වු විවිධ තැන්පතු ශේෂයෙන් රු.17,531,745 ක් වර්ෂ 02 සිට වර්ෂ 20 ක් දක්වා අතර කාල පරාසයකට අයත් විය. විශ්‍රාම වැටුප් තැනපතු ශේෂය වූ රු.189,014 ක් 1996 ත් 2008 ත් අතර කාල පරාසයට අයත් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

#### (අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

සමාලෝචිත වර්ෂය සඳහා නිකුත් කරන ලද විගණන විමසුම් 18 ක් සඳහා 2012 සැප්තැම්බර් 30 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එකී විමසුම් වලට භාජනය වු ගණනය කල හැකි ගනුදෙනු වල වටිනාකම රු.7,475,077 ක් විය. තවද, ඉකුත් වර්ෂ 02 ක කාලය තුල නිකුත් කර ඇති විගණන විමසුම් වලින් 17 කටද පිළතුරු ඉදිරිපත් කර නොතිබුණි.

#### (ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.363,246,411 ක්වූ වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

#### (ඇ) ගෙවීම් වවුචර විගණනයට ඉදිරිපත් නොකිරීම

වටිනාකම රු.240,899 ක්වූ ගෙවීම් වවුචර් 08 ක් විගණනයට ඉදිරිපත් නොකෙරින.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවු ආදායම රු.35,284,460 ක් වු අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවු ආදායම රු.36,966,222 ක් විය.

2011 අගෝස්තු 10 දින සභාව විසුරුවා හැරියද 2011 අගෝස්තු 10 සිට 31 දින දක්වා සහ ඔක්තෝබර් 01 සිට 19 දක්වා කාලය සඳහා පිළිවෙලින් රු.149,484 ක් හා රු.131,161 ලෙස

එකතුව රු.280,645 ක් මන්ත්‍රීවරුන් සඳහා දීමනා ගෙවා තිබුණි. මෙම වටිනාකම පළාත් පාලන කොමසාරිස් විසින්ද ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

## 2.2 බැංකු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2001 සිට 2008 දක්වා කාලය තුල නිකුත් කල නමුත් ගෙවීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් නොකරන ලද එකතුව රු.2,315,002 ක් වූ චෙක්පත් 374 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 ප්‍රකාර කටයුතු නොකර විවිධ තැන්පතු යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව, ගෙවීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් නොවූ මාස 06 කට වැඩි කාලයක් ඉක්මවූ එකතුව රු.253,281 ක් වූ චෙක්පත් 11 ක් සම්බන්ධයෙන්ද ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ඇ) එකතුව රු.82,896 ක් වූ අහරු චෙක්පත් 11 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 189 හා 486 හි විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 157,101 | 159,976 | 231,396 |
| (ii) | බදු කුලී | 15,948 | 15,963 | 8,024 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 20,516 | 16,793 | 2,567 |
| (iv) | වෙනත් ආදායම් | 221,612 | 220,517 | 147,267 |

### 2.3.2 ආදායම් අයකරගැනීමේ දුර්වලතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ආදායම් ශීර්ෂ 05 ක් යටතේ පුනරාවර්තන ආදායම් විෂයයන් 06 ක ඇස්තමේන්තුගත රු.4,010,000 ක ආදායම් වලින් සමාලෝචිත වර්ෂය තුල කිසිදු ආදායමක් එකතු කර නොතිබුණි.

(ආ) ආදායම් විෂයයන් 08 ක 50% සිට 96% දක්වා වු පරාසයකද, ආදායම් විෂයයන් 09 ක 25% සිට 50% දක්වා වු පරාසයකද, ආදායම් විෂයයන් 08 ක 10% සිට 25% දක්වා වු පරාසයකද, ඉලක්කගත ආදායම් උපයා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට අදාලව වරිපනම් හා බදු 22% ක ප්‍රමාණයක් පමණක් අයකර ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට අදාලව හිඟ බදු කුලී ආදායමින් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුනි. සමාලෝචිත වර්ෂයට අදාල වරිපනම්, බදුකුලී හා බලපත්‍ර ආදායම් 65% ක් පමණක් අයකර ගැනීමට හැකි වී තිබුණි.

### 2.3.3 වෙනත් ආදායම්

රජයේ ආයතන වෙත සපයා තිබූ ගලි බවුසර් වෙනුවෙන් 2007 වර්ෂයේ සිට රු.154,107 ක මුදලක් අයකරගෙන නොතිබුණි.

### 2.3.4 වෙළඳ සැල් කුලී

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙහිවල, ගල්කිස්ස, කොහුවල, සරණංකර, කරගම්පිටිය සහ රත්මලාන යන වෙළඳ සංකීර්ණ වල වෙළඳසැල් බදුකරුවන් 370 දෙනෙකුගෙන් 2011 දෙසැම්බර් 31 දක්වා රු.3,187,194 ක හඟ ශේෂයන් වු අතර එකී ශේෂය තුල ඉකුත් වර්ෂයේ හිඟ බදු රු.3,075,608 ක මුදලක් ඇතුළත් වී තිබුණි. බදු ගිවිසුම් වල 17 වැනි හා 19 වැනි කොන්දේසි ප්‍රකාර, සභාව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කොහුවල සහ ගල්කිස්ස වෙළඳ සංකීර්ණ වල කඩකාමර 04 ක බදු ගිවිසුම් වල කාලය පිළිවෙලින් 1996 ඔක්තෝබර්, 2004 ජුනි, 2006 ජුනි සහ 2008 ජුනි යන කාල වලදී අවසන් වී තිබුණද, 2012 ජුනි 30 දින වන විටත් නව බදු ගිවිසුම් වලට එළඹීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.5 ගොඩනැගිලි කුලී

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙහිවල පොලිසිය සහ සරණංකර පොලිස් මුරපොල පවත්වාගෙන යන ගොඩනැගිලි සඳහා වර්ෂ 11 කටත් වඩා වැඩි කාලයක සිට කුලී මුදල් ගෙවා නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අවසානයට හිඟ මුදල් වල එකතුව රු.1,338,848 ක් විය.

(ආ) තවත් ගොඩනැගිලි 17 ක බදුකරුවන්ගෙන් ඉකුත් වර්ෂ අවසානයට රු.1,128,584 ක් ද, සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,497,501 ක් ද අයවීමට තිබුණි.

**2.3.6 දැන්වීම් පුවරු ගාස්තු**

2011 දෙසැම්බර් 31 දින වන විට 2011 වර්ෂය වෙනුවෙන් දැන්වීම් පුවරු ගාස්තු සඳහා රු.2,189,265 ක් ද ඒ මත බදු වශයෙන් රු.315,518 ක් ද වශයෙන එකතුව රු.2,504,783 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

**2.3.7 වෙළඳ බලපත්‍ර ගාස්තු**

සමාලෝචිත වර්ෂය තුල හඳුනාගෙන තිබූ බලපත්‍ර නිකුත් කල යුතු වෙළඳ සැල් 914 කින්, වෙළඳ සැල් 111 ක් සඳහා පමණක් බලපත්‍ර ලබාදී තිබුණි. ඒ අනුව වෙළඳසැල් 803 ක බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර කටයුතු කර තිබුණි. එසේවුවද, බලපත්‍ර ගාස්තු සඳහා එම ආයතන වලින් මුදල් අයකර ගෙන තිබුණි.

**2.3.8 ව්‍යාපාර බදු**

සමාලෝචිත වර්ෂය තුල හඳුනාගෙන තිබූ ව්‍යාපාර බදු අයකරගත යුතු ආයතන 4,666 කින්, ආයතන 1919 ක් පමණක් බදු ගෙවා තිබුණ. ආයතන 2,747 කින් බදු අයකර නොතිබූ අතර 2011 වර්ෂය අවසානයට හිඟ බදු ශේෂය රු.2,567,000 ක් විය. සමාලෝචිත වර්ෂයට අදාල හිඟ බදු අයකර ගැනීමට ආයතන 127 ක් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ආරම්භ කර තිබුණි.

**2.4 වත්කම් කළමනාකරණය**

**2.4.1 ලැබිය යුතු ගිණුම්**

2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.46,772,557 ක් වූ අතර, වසර 04 කට වැඩි කාලයක් ඉක්මවා තිබූණු ගිණුම් ශේෂ වල එකතුව රු.2,403,130 ක් විය.

**2.4.2 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්**

නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිතව පැවති භෞතික සම්පත් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විස්තර පහත දැක්වේ.

(අ) වටිනාකම රු.4,991,140 ක් වූ වින්ච්න් යන්ත්‍ර 04 ක් වසර 07 කට වැඩි කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගනු ලැබූ රු.3,021,376 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ වර්ෂය අවසානය වන විටත් අදාල කායවර්ධන මධ්‍යස්ථාන, ළමා උද්‍යාණ හා ක්‍රීඩා සමාජ වෙත බෙදා හැර නොතිබුණි.

(ඇ) නගර සභා බල ප්‍රදේශය තුල ඇති ආයුර්වේද මධ්‍යස්ථාන වෙත බෙදා හැර තිබූ වර්තමාන වටිනාකම රු.73,217 ක් වූ නිම් ඖෂධ තොගයක් කල් ඉකුත් වී ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත් වී තිබුණි.

### 2.4.3 අයවීමට ඇති සේවක ණය

2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූණු සේවක ණය හා අත්තිකාරම් ශේෂවල එකතුව රු.131,594,471 ක් වූ අතර, එම ශේෂයට ඇතුළත්ව තිබුණු දීර්ඝ කාලයක් තුල අයනොවී පවතින එකතුව රු.2,978,202 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද, සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

### 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008 (iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව දෙපාර්තමේන්තු ප්‍රධානීන් හෝ ඒ හා සමාන නිලධාරීන් සඳහා පෙට්‍රල්/ඩීසල් වාහන සඳහා මාසයකට අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය ලීටර් 140 ක් වුවත්, නාගරික කොමසාරිස්වරයා 2011 වර්ෂය සඳහා අනුමත ලීටර් ප්‍රමාණය ඉක්මවා ලීටර් 1283 ක් ලබාගෙන තිබුණි.

(ආ) 1971 ජුලි 26 දිනැති අංක 810 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධානවලට අනනුකූලව වැටුප් රහිත නිවාඩු එම මාසයේදීම හෝ ඊළඟ මාසයේදී සම්පූර්ණයෙන්ම අයකිරීම වෙනුවට වාරික වලින් අයකර ගැනීමට කටයුතු කර තිබුණි.

### 2.6 අවිධිමත් ගණුදෙනු

නාගරික මන්ත්‍රීවරුන්ගේ ගමන් වියදම් ගෙවීමේදී බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ 2005 ජුලි 08 දිනැති අංක 1400/25 දරන ගැසට් නිවේදනයේ 2 වැනි වගන්තියේ විධිවිධානවලට පටහැනිව නියමිත සැතපුම් කුලී සීමාව ඉක්මවා 2010 වර්ෂයේදී රු.185,352 ක් ද, 2011 වර්ෂයේදී රු.96,836 ක්ද වශයෙන් එකතුව රු.282,188 ක වැඩිපුර ගෙවීමක් කර තිබුණි.

### 2.7 අධිභාර

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 226 (1) උප වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාර අනුව 2010 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණු අධිභාර අගය රු.1,106,576 ක් විය.

(ආ) රු.11,347,473 ක අගයකට අදාල ගනුදෙනු සම්බන්ධයෙන් මව්සින් ඉදිරියේදී අධිහාර පැනවීමට යෝජිතව ඇත.

## 2.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ගිව්සුම්ගත බැඳීමකට එළඹීමකින් තොරව හා කුලී අයකිරීමකින් තොරව පල්ලිය දොර පිහිටි සභාව සතු දෙමහල් ගොඩනැගිලි 02 ක් සහ පරිශ්‍රය දීර්ඝ කාලයක් සිට මුදල් අයකර පාඨමාලා පවත්වාගෙන යාම සඳහා ජාතික තරුණ සේවා සභාවට ලබා දී තිබුණි.

## 2.9 මෙහෙයුම් හා කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහා නගර සභා ආඥාපනතේ 218 වැනි වගන්තියේ විධිවිධාන පරිදි එක් එක් වර්ෂය සඳහා සභාවේ පරිපාලනය පිළිබඳ වාර්තාවක්, මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් වර්ෂය ඉක්මවූ පසුව හැකි ඉක්මනින් සභාව වෙත ඉදිරිපත් කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පරිපාලනය පිළිබඳ වාර්තාවක් සකස් කර නොතිබුණු අතර, මූල්‍ය ප්‍රකාශනද සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන කාර්යයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 4 වන පරිච්ඡේදයේ 2 වන වගන්තිය අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රසම්පාදන කාලසටහන් පිළියෙල කළ යුතු අතර, මේ සඳහා ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 4.2.1, 4.2.2 හා 4.2.3 ආකෘති වල දැක්වෙන උපදෙස් අනුගමනය කල යුතු වුවද, සභාව විසින් ඉදිකිරීම් කටයුතු සිදු කිරීමේදී ඒ සඳහා ප්‍රසම්පාදන සැලැසුම් සහ කාල සටහන් පිළියෙල කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනට නොපියවූ රු.1,416,507 ක් වූ අත්තිකාරම් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371 නියමය අනුවනිරවුල් කර නොතිබුණි.

## 2.10 අයවැය පාලනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අයවැය මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණු පුනරාවර්තන වැය විෂයයන් 17 ක් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 17 ක් යටතේ ඇස්තමේන්තු කර තිබුණු පිළිවෙලින් රු.1,398,000 ක් සහ රු.95,875,000 ක් වූ ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) වැඩසටහන් 05 යටතේ පුනරාවර්තන වැය විෂයයන් 20 ක 50% සිට 97% දක්වා පරාසයකද, වැය විෂයයන් 09 ක 25% සිට 50% දක්වා පරාසයකද, වැය විෂයයන් 16 ක 10% සිට 25% දක්වා පරාසයකද ප්‍රතිපාදන ඉතිරිවීම් නිරීක්ෂණය විය.

i. ප්‍රතිපාදන සලසාගෙන ගෙන තිබුණු ප්‍රාග්ධන වැය විෂයයන් 10 ක අයවැයගත ප්‍රතිපාදන සීමාවන් ඉකමවා රු.10,127,000 ක වියදම් දරා තිබුණි.

ii. වර්ෂය තුලදී ආදායම් හා වියදම් ශීර්ෂ අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුව ද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර, සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන තිබූ බවක් නිරීක්ෂණය නොවීය.

## 2.11 සංයුක්ත සැලැස්ම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ අංක 5 ජේදය අනුව පහත දැක්වෙන සැලැසුම් සහ වාර්තා සකස් කල යුතුව තිබුණද ඒවා පිළියෙල කර නොතිබුණි.

(අ) අවම වශයෙන් වර්ෂ 3 ක් සඳහා වු සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීම.

(ආ) සංයුක්ත සැලැස්මට අනුකූලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම.

(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හා 402 (i) හි දැක්වෙන උපදෙස් කෙරෙහි අවධානය යොමුකර ක්‍රියාකාරී සැලැස්ම සමඟ සසඳමින් නියමිත දිනයකදී වාර්ෂික කාර්ය සාධන වාර්තා පිළියෙල කර අදාල ආයතන වෙත ඉදිරිපත් කිරීම.

## 2.12 අභ්‍යන්තර විගණනය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 133 (1) සහ (2) හි දැක්වෙන විධිවිධාන පරිදි අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු සංවිධානය කරගෙන නොතිබුණි.

(ආ) මු.රෙ. 134 (1),(2) හා (3) හි දැක්වෙන පරිදි,

i. ආයතනයේ මුදල් හා පරිපාලන කටයුතු වලින් නිදහස් වු ඒකකයක් ලෙස ක්‍රියා කිරීම,

ii. අභ්‍යන්තර විගණන වැඩසටහන් විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව සකස් කිරීම,

iii. අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම

යනාදී කරුණු සම්බන්ධයෙන් යොමුගත විධිවිධාන වලට අනුකූලව කටයුතු කර නොතබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) අයවැය පාලනය

(ඈ) ආදායම් පරිපාලනය

(ඉ) වත්කම් කළමනාකරණය

(ඊ) ණයගැති, ණයහිමි පාලනය

(උ) මානව සම්පත කළමනාකරණය